**1990 සුවසැරිය පදනම - 2025**

**-----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

1990 සුවසැරිය පදනමේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය,සමුච්චිත අරමුදල වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ලාභ අරමුණු කර නොගත් සංවිධාන සඳහා නිර්දේශිත ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ලාභ අරමුණු කර නොගත් සංවිධාන සඳහා නිර්දේශිත ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය පදනම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි පදනම ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකබව මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ විගණනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ පදනමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, පදනම ක්‍රියා කර ඇති බව,
- පදනම සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- පදනම සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 18 දරන 1990 සුවසැරිය පදනම පනතේ 18 (5) සහ 25 (1) වගන්ති | පනතේ 18 (5) වගන්තිය ප්‍රකාරව කළමනාකරණ මණ්ඩලය විසින් අරමුදලින් මුදල් ගෙවීම සම්බන්ධයෙන් රීති සකස්කළ යුතු අතර 25(1) වගන්තියේ සඳහන් කරුණු සම්බන්ධයෙන්ද රීති සකස් කරනු ලැබිය හැකිය. එසේ පදනම විසින් සාදනු ලබන සෑම රීතියක්ම අමාත්‍යවරයා විසින් අනුමත කර ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු වුවද, පදනම ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මූල්‍ය රීති සකස් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුවේ අනුමැතිය සඳහා දැනටමත් යොමුකර ඇති බව සහ පනතේ 25(1) වගන්තිය අනුව සකස් කළ හැකි රීති පිළිබඳ නීති උපදෙස් ලබාගෙන එම නීති උපදෙස් ප්‍රකාරව ඉදිරි කටයුතු කරන බව. | අරමුදලින් මුදල් ගෙවීම සම්බන්ධයෙන් රීති සකස්කර අමාත්‍යවරයා විසින් අනුමත කර ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය. |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(2) වගන්තිය | පනතේ 38 (I) වගන්තියේ (ඇ) ඡේදය ප්‍රකාරව මූල්‍ය පාලනය සඳහා සකස්කළ අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව සමාලෝචනය ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සභාව ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අභ්‍යන්තර පවත්වන්නාවූ කළමනාකරණ තීරණයන් විගණකාධිපති වෙත යොමු කිරීමක් සිදු කර නොමැති බව සහ ඉදිරියේදී ගනු ලබන එවන් ලිඛිත තීරණ ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බව. | අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව සමාලෝචනය ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් | රජයේ මුදල්, බඩු බාහිරාදිය භාර ගැනීම හෝ බාරව සිටීම, එසේ නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් | ඉදිරියේදී අදාළ ඇප මුදල් තබාගැනීමට කටයුතු කරන බව. | ඇප තැබිය යුතු නිලධාරින් ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | රෙගුලාසි 880 | වගකිව යුතු නිලධාරීන්ද, රජයේ ගිණුමට අදාළ වවුචර, සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරි කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත්, පදනමේ ඇප තැබිය යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 01/2021 චක්‍රලේඛය මගින් හඳුන්වා දී ඇති | | | |
| (i) | මාර්ගෝදේශ සංග්‍රහයේ 2.3 ඡේදය | අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සමඟ වාර්ෂික අයවැය ලේඛනයද ඇතුළත් උපායමාර්ගික සැලැස්මක් සකස් කළ යුතු අතර එම සැලැස්ම අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හරහා, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. ඉහත පරිදි අනුමත නොකරන ලද ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කළද එම සැලැස්ම මාර්ගෝපදේශය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි. | 2025 හා 2026 යන වර්ෂ දෙක සඳහාම මෙම උපාය මාර්ගික සැලැස්ම සකස් කර ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බව. | අදාළ සැලසුම් සකස් කර අනුමැතීන් ලබාගෙන ඒ මත මෙහෙයුම් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ii) | මෙහෙයුම් අත්පොතෙහි 3.3 ඡේදය | එක් එක් අංශයේ සේවක අවශ්‍යතාවය හා සංවිධාන සටහන ඇතුළත් | නීතිමය උපදෙස් හා කළමනාකරණ සේවා | මෙහෙයුම් අත්පොත ප්‍රකාරව උපායමාර්ගික |

| | | | | |
|---|---|---|---|---|
| | | උපායමාර්ගික මානව සම්පත් සැලැස්මක් සකස් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ ද උපදෙස් ලබාගෙන ඉදිරි කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වන බව. | මානව සම්පත් සැලැස්මක් සකස් කළ යුතුය, |
| | (iii) මෙහෙයුම් අත්පොතෙහි 3.6 ඡේදය | උපාය මාර්ගික සැලැස්ම, ක්‍රියාකාරී සැලසුම් මත පදනම්ව ඵලදායී කාර්යසාධන ඇගයුම් පද්ධතියක් හඳුන්වා දී සේවකයා හා කළමනාකාරීත්වය අතර ප්‍රධාන කාර්යසාධන දර්ශක ක්‍රියාත්මක විය යුතුය. එක් එක් සේවකයාගේ ඵලදායීතාවය ආසන්න නිලධාරියා විසින් ඇගයීමට ලක්කළ යුතු වුවද, පදනම විසින් නිලධාරීන් සඳහා ඵලදායී කාර්යසාධන ඇගයුමක් කර නොතිබුණි. එසේම සුවසැරිය පදනමේ කාර්ය මණ්ඩලයට අදාළ වැටුප් ව්‍යුහය 2019 අගෝස්තු 01 දින සිට අනුමත කර තිබුණද වාර්ෂික වැටුප් වර්ධක ව්‍යුහයක් දක්වා නොතිබුණි. | දැනට සිදු කරමින් යන්නා වූ ක්‍රියාවලියම ලිඛිත ලේඛනයන්ද භාවිතයට ගනිමින් සේවක කාර්ය සාධන ඇගයීමට බලාපොරොත්තු වන බව සහ වාර්ෂික වැටුප් වර්ධක ව්‍යුහයක් සකසා ගැනීමට බලාපොරොත්තු වන බව. | සැලසුම් මත පදනම්ව ඵලදායී කාර්යසාධන ඇගයුම් පද්ධතියක් හඳුන්වා දිය යුතුය. |
| (ඉ) | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2022 ජුලි 08 දිනැති අංක SA/MAA/GRG/01 දරන මාර්ගෝපදේශය | පදනමට ලබාදෙන පරිත්‍යාග ප්‍රථමයෙන් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ නිල ගිණුමට මාරුවනු පිණිස භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු අතර පසුව ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමෙන් අනතුරුව නියමිත අක්මුදල් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කළ යුතු වුවත් 2025 වර්ෂය තුළ ලැබුණු පරිත්‍යාග | දැනට සකස් කර, අනුමැතිය සඳහා යවා ඇති මූල්‍ය රීති වල මෙම පරිත්‍යාග ගිණුම් තැබීමේ විධිවිධාන ඇතුළත් කර ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වන බව සහ විගණනය විසින් පෙන්වා දෙන පරිදි ද ඉදිරි කටයුතු කරන බව. | පදනමට ලබාදෙන පරිත්‍යාග භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | මුදල් රු.2,153,480 ක් යථෝක්ත මාර්ගෝපදේශය ප්‍රකාරව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | | |
| (ඊ) | 2018 අප්‍රේල් 24 දින සෞඛ්‍ය අමාත්‍යාංශය හා GVK EMRI Lanka (Private) Ltd ආයතනය සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම හා 2018 අංක 18 දරන 1990 සුවසැරිය පදනම පනතේ 26 (ඇ) වගන්තිය | මූල්‍ය ප්‍රකාශන අනුව 2025 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය රු.466,774,480ක් වූ අතර ඉන් රු.335,091,526 ක් රජය විසින් ප්‍රතිපූරණය කළ යුතු පුනරාවර්තන වියදම් විය. එම ශේෂය තුළ පවතින 2018 වර්ෂයේ සිට පැවත එන රු.330,091,526 ක මුදල සමාලෝචිත වර්ෂයේදී ද භාණ්ඩාගාරය විසින් ප්‍රතිපූර්ණය කර නොතිබුණු අතර මෙම මුදල 2018 සහ 2019 වර්ෂයන්හිදී 1990 සුවසැරිය ගිලන්රථ සේවාව පවත්වා ගැනීම වෙනුවෙන් දරන ලද වියදමක් බැවින් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කර නිරවුල් කිරීම සුදුසුබව ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක BD/HRD/111/24/2025 දරන ලිපිය හා 2025 දෙසැම්බර් 30 දිනැති ලිපිය මගින් දන්වා තිබුණ ද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ 2025 දෙසැම්බර් 30 දිනැති අංක BD/HRD/111/24/2025 දරන ලිපියේ සඳහන් උපදෙස් හා කරුණු මත පදනම්ව ඉදිරි කටයුතු සිදු කරන බව. | අමාත්‍ය මණ්ඩලය දැනුවත් කර ලැබිය යුතු මුදල් නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1 (අ) ඡේදය | අස්ථිත්වයක් විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු අතර අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කළ යුතු වුවද, පදනම විසින් ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණේ සමාලෝචිත වර්ෂය සඳහා | ප්‍රසම්පාදන සැලැස්ම හා කාලසටහන් පිළියෙල කරන ලද්දේ ද ඉතා අසීරු තත්වයක් යටතේ බව සහ විගණනය විසින් පෙන්වා දෙන පරිදි ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බව. | වසර 03 කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුය. |

පමණක් වූ අතර එය තුළ ද ප්‍රාග්ධන වත්කම් ප්‍රසම්පාදන පිළිබඳව සඳහන් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 350,021,993 ඌනතාවයක් ක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 53,278,736 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 403,300,729 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආදායම රු.207,490,754 ක් වැඩිවීමේදී, මෙහෙයුම් වියදම් රු.610,785,375 ක් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සුවසැරිය පදනම විසින් ග්ලූකෝස් හා ලැක්ටේට් මට්ටම් හඳුනාගැනීමේ විශේෂාංග සහිත වැටීම් හඳුනාගැනීම සඳහා පැළඳිය හැකි සංවේදකයක් සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ පුද්ගලික සමාගම හා හොංකොං හි ලියාපදිංචි ආයතනයක් සමඟ 2021 වර්ෂයේ පෙබරවාරි මස ගිවිසුම්ගතවී තිබුණි. මෙම ව්‍යාපෘතිය වැටීම් හඳුනාගැනීමේ සංවේදක මෘදුකාංගය නිර්මාණය කිරීම, ශරීරයේ ග්ලූකෝස් මට්ටම හා ලැක්ටේට් මට්ටම් හඳුනාගැනීමේ උපකරණයක් නිර්මාණය කිරීම හා ශරීරයේ ග්ලූකෝස් මට්ටම හා ලැක්ටේට් මට්ටම් හඳුනාගැනීමේ උපකරණය හා වැටීම් හඳුනාගැනීම් සංවේදක යන දෙකම ඇතුළත් කර පැළඳිය හැකි උපකරණයක් සංවර්ධනය කිරීම යනුවෙන් අදියර 3 කින් සමන්විත විය. පදනම රු.6,601,850 ක් වැයකර සංවේදක මෘදුකාංගය නිර්මාණය කර වර්ෂ 3ක් ඉක්මවා තිබුණද අනෙකුත් කාර්යයන් ඉටුකර ගැනීමට පරිත්‍යාගශීලියෙකු හමුනොවීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය අතරමඟ නවතා දමා තිබුණි. | මෙම ව්‍යාපෘතිය අතරමඟ නවතා දමා නොමැති බවත් අදාළ පිරිවිතරයන් සපුරාලන ආකාරයේ පරිත්‍යාගශීලියකු හමුවූ වහාම මෙම සමස්ථ ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට හැකි වන බව. | සැලසුම්ගත කාල සීමාව තුළ ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට හැකිවන පරිදි පරිත්‍යාගශීලියෙකු සොයාගැනීමට හෝ විකල්ප අරමුදල් සම්පාදන ක්‍රමවේද හඳුනාගැනීමට කටයුතු කළයුතුය. |

### 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කෘත්‍රිම බුද්ධි තාක්ෂණය යොදා ගනිමින් සම්බන්ධිත ගිලන්රථ (Connected Ambulance) සේවාවක්, පදනමේ හදිසි ගිලන්රථ සේවාවට යොදාගැනීම සඳහා ආරම්භ කරන ලද සම්බන්ධිත ගිලන්රථ ව්‍යාපෘතියට 2023 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් රු.21,685,500 ක් වූ ටැබ් පරිගණක 385 ක් හා රු.7,400,000 ක්වූ මුද්‍රණ යන්ත්‍ර 250 ක් ලබාදී තිබුණද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට 2026 මාර්තු 16 දින වන විටත් කළමනාකරණය කටයුතු කර නොතිබීමෙන් එකතුව රු.29,085,500 ක් වූ ඉහත සඳහන් උපකරණ නිෂ්කාර්යව පැවතුණි. | අවශ්‍ය දෘඩාංග සුරක්ෂිත කිරීමේ වැදගත්කම සහ පරිත්‍යාගශීලීන්ගේ සහාය අහිමි වීම වළක්වා ගැනීම සැලකිල්ලට ගනිමින්, පරිත්යාගය පිළිගැනීමට තීරණය කළ බව සහ මෙම තීරණය මඟින් ව්‍යාපෘතියට මූල්‍යමය බාධාවකින් තොරව ඉදිරියට යා හැකි බව සහතික කළ අතර මෘදුකාංග පිරිපහදු කිරීම (Software refinement) දිගටම කරගෙන යන අතරතුර සූදානම් කිරීමේ කටයුතු ඉදිරියට ගෙන යාමට ඉඩ සැලසී ඇති බව. | පරිත්‍යාගශීලීන් ලබාදෙන පරිත්‍යාග ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ජාතික තරඟකාරී ලංසු කැඳවීම මගින් මිලගණන් කැඳවා ගිලන්රථ සඳහා පිරිවැය රු.212,046,000 ක්වූ රෝගීන් නිරීක්ෂණ උපකරණ 300 ක් 2025 දෙසැම්බර් 31 දින මිලදී ගෙන තිබුණද, මේ දක්වා අදාළ කාර්යය සඳහා යොදවා නොතිබුණි. | මෙම උපකරණ අදාළ කාර්යයට යෙදවීමට පෙර මෙය භාවිතා කිරීමට අදාළව පද්ධති ස්ථාපනය කළ යුතු බව සහ ගිලන්රථ තුළ මෙය රැඳවීමට විශේෂිත ආරක්ෂිත ආධාරකයක් ද සවි කළ යුතු බවත් මේ සඳහා අවශ්‍ය කටයුතු අවසාන අදියරේ පවතින බව. | රෝගීන් නිරීක්ෂණ උපකරණ අදාළ කාර්යය සඳහා කඩිනමින් යොදවා ගත යුතුය. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2025 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 1992 ක් වූ අතර එදිනට තත්‍ය කාර්ය මණ්ඩලය 1291 ක් වූයෙන් කාර්ය මණ්ඩල ඌනතාවය 701 ක් විය. තවද අනුමත තනතුරු 42 න් තනතුරු 11 ක් පුරප්පාඩුව පැවති අතර එම තනතුරු 11 ට අදාළ කාර්ය මණ්ඩලය 15 ක් විය. ඒ | ප්‍රධාන විධායක නිලධාරී තනතුර සඳහා වෙබ් අඩවිය තුළ දැන්වීමක් පළ කළ බවත් මෙහි ඉදිරි කටයුතු සිදු කරමින් සිටින බවත් සහ මූල්‍ය ප්‍රධානී, මානව සම්පත් හා පරිපාලන ප්‍රධානී හා පුහුණුව සහ ප්‍රොටෝකෝල වැනි ප්‍රධානී තනතුරු සඳහා ද වෙබ් අඩවිය තුළ | ඉහළ කළමනාකරණ මට්ටමේ තනතුරු හා අනෙකුත් තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළයුතුය. |

| | | |
|---|---|---|
| අතරින් තත්ත්ව විශ්ලේෂක තනතුරු සංඛ්‍යාව 5 ක් වූ අතර එම තනතුරු 2022 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතිණි. එසේම සහකාර සැපයුම් දාම කළමනාකරු තනතුරද 2018 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතිණි. තවද ප්‍රධාන විධායක නිලධාරී, මූල්‍ය ප්‍රධානී සහ මානව සම්පත් හා පරිපාලන ප්‍රධානී යන ඉහළ කළමනාකරණ මට්ටමේ තනතුරු තුනක් සමාලෝචිත වර්ෂය තුළදී පුරප්පාඩුව පැවතීම ඉදිරි කාර්යසාධනය කෙරෙහි අහිතකර ලෙස බලපෑමේ අවධානමක් පැවතුණි. | දැන්වීම් පළ කිරීමට බලාපොරොත්තු වන බව. | |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත සෑම ආයතනයක්ම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට කෙටුම්පත් වාර්ෂික වාර්තාව සමඟ විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2026 අප්‍රේල් 21 දින ඉදිරිපත් කළ අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2026 ජූනි 15 දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

**4.2 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (i) වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොතිබුණු අතර පදනම ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අභ්‍යන්තර විගණන ඒකකයක්ද පිහිටුවා නොතිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුව විසින් තනතුරු අනුමත කල වහාම අභ්‍යන්තර විගණන අංශය පිහිටුවීමට කටයුතු කරන බව. | ජාතික විගණන පනත ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයෙකු පත් කළ යුතුය. |